<u>අපි වවලයි අපි කන්නේ කෘෂිකර්ම සංවර්ධන කඩිනම් වැඩසටහන</u>

## ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම-2019 වර්ෂය

01. ව්‍යාපෘතියේ නම-කලවිටි ආශ්‍රිත කාබනික ආහාර භෝග නිෂ්පාදනය කරන ව්‍යවසායකයින් නගා සිටුවීම

02ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ස්ථානය

| දිස්ත්‍රික්කය | ප්‍රා.ලේ කාර්යාලය | ගොවිජන සේවා බල ප්‍රදේශය | ග්‍රාම නිලධාරී වසම |
|---|---|---|---|
| ගාල්ල | යක්කලමුල්ල | යක්කලමුල්ල | කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් පහක් |

03..ව්‍යාපෘතියේ අවශ්‍යතාවය

3.1 හැඳින්වීම

ග්‍රාමීය ආර්ථිකයට හිමිකම් ඇති යක්කලමුල්ල කොට්ඨාසයේ ගෙවතු වගාවට බොහෝ පිරිසක් නැඹුරුව සිටී.එහෙත් බොහෝ ව්‍යවසායකයින්ගේ ගෙවත්ත තුළ පවතින ඉඩකඩ ප්‍රමාණය සීමා වී ඇති නිසා කලවිටි වගාවට බොහෝ ගොවීන්ගේ නැඹුරුවක් දැකගත හැකිය.කලවිට යනු කුඹුරු ආශිත ඉතා සරු පසක් සහිත ගොඩබිමට ආසන්නව පහසුවෙන් වගා කටයුතු සිදුකළ හැකි භූමියකි.අල භෝග ,එළවළු භෝග හා පළා වර්ග කාබනික පොහොර භාවිතය තුළින් නිෂ්පාදනය කර පාරිභෝගිකයින්ට ලබාදීමට අපේක්ෂා කරයි.

3.2.ව්‍යාපෘතියේ අරමුණු

- වසවිසෙන් තොර නැවුම් එළවළු වෙළඳපොළට නිකුත් කිරීම
- කාබනික නිෂ්පාදන සිදු කරන ව්‍යවසායකයින් නගා සිටුවීම
- කෘෂි ව්‍යවසායකයින්ගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම
- වසවිසෙන් තොර ආහාර පරිභෝජනය තුළින් නීරෝගී පුද්ගලයින් පිරිසක් සමාජයට දායාද කිරීම

3.3ව්‍යාපෘතිය මඟින් ආමන්ත්‍රණය කරනු ලබන ගැටළුව

කොට්ඨාසය තුළ කලවිටි ආශ්‍රිතව ආහාර භෝග නිෂ්පාදනය කරන බොහෝ පිරිසක් සිටියද ඔවුන්ට තම නිෂ්පාදන අලෙවි කිරීමට සුදුසු වෙළඳපොළක් හඳුනා ගැනීමට පවතින දුෂ්කරතාවය නිසා අඛණ්ඩව තම නිෂ්පාදන නොකරන තත්වයක් දැකගත හැකිය.මෙම තත්වය මඟහරවා ගනිමින් ගොවීන්ට සුදුසු වෙළඳපොළක් සකසා දීමට හා කාබනික ආහාර භෝග නිෂ්පාදනයට යොමු කිරීමට මෙම ව්‍යාපෘතිය මඟින් අපේක්ෂා කරයි.

3.4ගැටළුව නිරාකරණය කර ගැනීම පිණිස ව්‍යාපෘතිය මඟින් යෝජිත වැඩපිළිවෙළ

යක්කලමුල්ල කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් පහක කලවිටි ආශ්‍රිතව ආහාර භෝග වගා කරන ප්‍රතිලාභීන් 25දෙනෙකු තෝරා ගනු ලබයි.මෙහිදී එක් එක් වසමේ ආර්ථික සංවර්ධන නිලධාරී ,කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරී හරහා ප්‍රතිලාභීන් තෝරාගනු ලබයි.බිම් සකස් කිරීමේ සිට ආහාර භෝග වෙළඳපොළට නිකුත් කරන තෙක් අවශ්‍ය තාක්ෂණික උපදෙස් ලබාදීම කෘෂිකර්ම උපදේශක හා

කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරී හරහා සිදු කිරීමට නියමිතය.මෙහිදී ගොවීන්ගේ අවශ්‍යතා ඔවුන් තුලින්ම හඳුනාගෙන ඔවුන්ට රු.5000.00ක උපරිමයකට යටත්ව උපකරණ කට්ටලයක් ලබා දීමට හා බිම් සකසා අවසාන වූ පසු ඕ සඳහා රු.5000.00ක දීමනාවක් ලබාදීමට (අදාල වසමෙහි කෘ.ප.නි.ස.නිර්දේශයෙන්)මෙම ව්‍යාපෘතියතුලින් අපේක්ෂිතය.මෙම ව්‍යාපාතියේ පසු විපරම් කටයුතු කෘෂිකර්ම සංවර්ධන නිළධාරීන් විසින් සිදුකරන අතර සහකාර සැලසුම් අධ්‍යක්ෂක විසින් හා අවශ්‍ය අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම් විසින් අධීක්ෂණ කටයුතු සිදුකරනු ඇත.

3.5 ප්‍රතිලාභීන් පිළිබඳ විස්තර හා සංඛ්‍යාව

යක්කලමුල්ල කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් පහක් තුළින් කලවිටි ආශ්‍රිතව කාබනික පොහොර භාවිතයෙන් එළවළු හා පළා වර්ග වගා කරන ගොවීන් විසිපස් දෙනෙක් සඳහා මෙම ව්‍යාපෘතිය මඟින් ප්‍රතිලාභ ලබා දීමට අපේක්ෂිතය.එමෙන්ම වසවිසෙන් තොර නැවුම් ආහාර භෝග පරිභෝජනය කිරීමට ගම්වැසියන්ට අවස්ථාව පුළුල්වීම නිසා සමාජ ප්‍රතිලාභයක් ජනිත කරවීමටද මෙම ව්‍යාපෘතිය මඟින් සිදුවේ.

4.ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ

- වසවිසෙන් තොර නැවුම්ආහාරභෝගපරිභෝජනය කිරීමට ගම්වැසියන්ට අවස්ථාව සැලසීම
- කාබනික නිෂ්පාදන සිදුකරන ව්‍යවසායකයින්ගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීම
- වසවිසෙන්තොරනැවුම්ආහාරභෝග ගම තුලින්ම සපයා ගැනීමට හැකියාව ලැබීම
- වසවිසෙන්තොරනැවුම්ආහාරපරිභෝජනය මඟින් නීරෝගී පිරිසක් සමාජයට දායාද කිරීම

**5.වියදම් ඇස්තමේන්තුව**

| අනු අංකය | ක්‍රියාකාරකම්(විස්තරාත්මකව) | ඒකකයක මිල | ප්‍රමාණය | ඇස්තමේන්තුව | |
|---|---|---|---|---|---|
| | | | | ගොවි දායකත්වය(25%)(රු) | රජයේ දායකත්වය(75%) |
| **01** | උපකරණ හා අමු ද්‍රව්‍ය<br>❖ උදළුතල<br>❖ මල් බාල්දි<br>❖ මුල්ලු<br>**කොම්පෝස්ට් (50කි.ග්‍රෑම්)** | <br>1,200.00<br>850.00<br>1,600.00<br>750.00 | <br>25<br>25<br>25<br>25 | <br>7,500.00<br>5,312.00<br>10,000.00<br>4,687.50 | <br>**22,500.00**<br>**15,937.50**<br>**30,000.00**<br>**14,062.50** |
| **02** | **බිම් සකස් කිරීම සඳහා (100% දායකත්වය රජයෙනි)** | **5,000.00** | **25** | **-** | **125,000.00** |
| **03** | **පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායක දීමනා** | **1,200.00** | **02** | **-** | **2,400.00** |
| **04** | **සංග්‍රහ වියදම්** | **70.00** | **25** | **-** | **1,750.00** |
| **05** | **පරිපාලන වියදම්(3%)** | | | | **33,849.50** |
| **06** | **මුළු වියදම** | | | **27,500.00** | **245,499.50** |

සංවර්ධන නිලධාරී(කෘෂිකර්ම) නිර්දේශය(නිල මුද්‍රාව)

සකස් කලේ

6.කාලසීමාව

6.1ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම් ආරම්භ කිරීමට අපේක්ෂිත කාලය-2019 පෙබරවාරි

6.2 ව්‍යාපෘතිය/ක්‍රියාකාරකම් අවසන් කිරීමට අපේක්ෂිත කාලය-2019 දෙසැම්බර්

7. ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු එය සාර්ථකව ඉදිරියට පවත්වා ගැනීම සඳහා වන වැඩපිළිවෙල

මෙම ව්‍යාපෘතියේ පසු විපරම් කටයුතු කෘෂිකර්ම සංවර්ඳන නිලධාරීන් විසින් සිදුකරන අතර සහකාර සැලසුම් අධ්‍යක්ෂක විසින් හා අවශ්‍ය අවස්ථාවලදී ප්‍රාදේශීය ලේකම් විසින් අධීක්ෂණ කටයුතු සිදුකරනු ඇත.

8. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය භෞතික හා මානව සම්පත් තිබේද විස්තර කරන්න.

කලවිටි ආශ්‍රිතව භෝග වගා කරන ගොවීන් යක්කලමුල්ල කොට්ඨාසයේ සුලභව සිටින අතර ඔවුන්ගෙන් නවක ව්‍යවසායකයන්හට අවශ්‍ය විධිමත් තාක්ෂණික දැනුම ලබා දීමට අපේක්ෂිතය.ඒ සඳහා සම්පත් දායකත්වය ලබා ගැනීම කොට්ඨාසය තුලින්ම සිදුකරගත හැකිවීම සතුටුදායක තත්වයකි.

සකස් කිරීම හා ඉදිරිපත් කිරීම -ප්‍රාදේශීය ලේකම්

................................ ..................................... ................................

අත්සන නිල මුද්‍රාව දිනය

නිර්දේශය-දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ

................................ ..................................... ..............................

අත්සන නිල මුද්‍රාව දිනය

නිර්දේශය-දිස්ත්‍රික් ලේකම්

................................ ..................................... ..............................

අත්සන නිල මුද්‍රාව දිනය

<u>කාර්යාලීය ප්‍රයෝජනය සඳහා</u>

ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශය-නිර්දේශ කරමි/නොකරමි

.............................. ..................................... ..............................

අත්සන නිල මුද්‍රාව දිනය

ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය -අනුමත කරමි/නොකරමි

| | | |
|---|---|---|
| ................................ | ...................................... | .............................. |
| අත්සන | නිල මුද්‍රාව | දිනය |

ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සම්බන්ධ කර ගත යුතු නිලධාරියාගේ තොරතුරු

| | |
|---|---|
| නම | - කේ.යූ.ජී.එන්.එන්. කාරියවසම් |
| ලිපිනය | -ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,යක්කලමුල්ල |
| දුරකථන අංකය | - 0769350958 |
| ෆැක්ස් අංකය | -091-2286038 |

ව්‍යාපෘතිය නිර්දේශ කිරීම

| | |
|---|---|
| අත්සන | - |
| නම | - චන්දිම සී.මුහන්දිරම්ගේ |
| ලිපිනය | - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,යක්කලමුල්ල |
| දුරකථන අංකය | - 091-2286038 |
| ෆැක්ස් අංකය | - 091-2286038 |